# 11 දැහැමි රාජ්‍ය පාලනය අගයමු

බුදුදහම හුදෙක් පරලොව දියුණුවට පමණක් අදාළවන්නක් නො වේ. එය පුද්ගලයාගේ මෙන් ම සමාජයේ ද ලෞකික දියුණුව පිළිබඳ ව ද කරුණු දක්වයි. ඒ සඳහා උපදෙස් ද ලබා දෙයි. රාජ්‍ය පාලනය පිළිබඳ ව එන ඉගැන්වීම් විමසා බැලීමේ දී ද ඒ බව පසක් වෙයි. රටක ප්‍රධාන පුරවැසියා වන්නේ එම රටේ පාලකයා ය. ඔහුගේ ක්‍රියා කලාපය එම රටේ සෞභාග්‍යයට හෝ විනාශයට හේතු වේ. ඒ අනුව බුදුදහම අවධාරණය කරන්නේ පාලකයා සමාජ ආචාර ධර්ම රකින, ධාර්මික පිළිවෙත් අනුගමනය කරන්නකු විය යුතු බව යි. මීට අදාළ බෞද්ධ ඉගැන්වීම් අතර,

- දස රාජධර්ම
- දස සක්විති වත්
- සප්ත අපරිහානීය ධර්ම
- සතර අගතියෙන් වැළකීම
- සතර බ්‍රහ්ම විහාර
- සතර සංග්‍රහ වස්තු
- පඤ්චසීල ප්‍රතිපදාව

යන කරුණු සුවිශේෂ වේ. මෙම ඉගැන්වීම් මගින් බෞද්ධ රාජ්‍ය පාලනයක පැවතිය යුතු ශික්ෂණය, සදාචාරාත්මක බව, සමගිය, සමෘද්ධිය, සමානාත්මතාව, නිදහස හා දැහැමිබව ද වෙසෙසින් අවධාරණය වේ. මේවා රාජ්‍ය පාලනයට පමණක් නොව එදිනෙදා ජීවිතයේ දී ද වෙනත් පාලන කටයුතුවල දී ද ආදර්ශ ගත හැකි පිළිවෙත් ය. එ බැවින් ඒ පිළිවෙත් එකිනෙක මෙ සේ විමසා බලමු.

## දස රාජධර්ම

දැහැමි පාලනයකට අවශ්‍ය වන එක් ඉගැන්වීමකි දසරාජධර්ම. ඒවා පාලකයකු විසින් අනුගමනය කළ යුතු ශ්‍රේෂ්ඨ ගුණ ධර්ම දහයක් වශයෙන් හඳුන්වාදිය හැකි ය.

- දානය
- සීලය
- පරිත්‍යාගය
- ඍජු බව
- මෘදු බව
- තපස
- අක්‍රෝධය
- අවිහිංසාව
- ඉවසීම
- අවිරෝධතාව හෙවත් නොගැටෙන සුලු බව

මෙම ගුණධර්මවලින් දනය යනු දීම යි. එහෙත් මෙයින් ආගමික මුහුණුවරකින් කරන පින්කමක් ම අදහස් නො කැරේ. රටවැසියන් උදෙසා ආහාර පාන, ඇඳුම් පැළඳුම් සනීපාරක්ෂක පහසුකම්, අධ්‍යාපනය ආදි අවශ්‍යතා සපයා දීම මින් අදහස් වෙයි.

එසේ ම කෘෂි කර්මාන්තය සඳහා ගොවීන්ට අවශ්‍ය මූල බීජ, පොහොර ගොවිබිම් ආදිය ලබා දීමත්, වෙළෙඳ කටයුතු සඳහා වෙළෙඳුන්ට අවශ්‍ය ප්‍රාග්ධනය ලබා දීමත් සුදුසුකම් වලට අනුව රාජ්‍ය සේවයට බඳවා ගැනීමත් මෙහි දී දානය ලෙස හැඳින්විය හැකිය. කිසියම් පාලකයෙක් එසේ නො කරයි නම් එම රට තුළ සොරකම, මංකොල්ලකෑම, මනුෂ්‍ය ඝාතනය හා දේශපාලන අස්ථාවරභාවය ඇති වීම නො වැළැක්විය හැකි ය. මේ නිසා ලෞකික ආර්ථික දියුණුව ඇති කිරීමට ද පාලකයා විසින් දාන ප්‍රතිපදාව අනුගමනය කළ යුතු බව පැහැදිලි වේ.

**සීලය** යනු පාලකයා චරිතවත් පුද්ගලයකු වීම යි. එ නම් යුක්තිගරුක ව, ස්ථිර අධිෂ්ඨානයෙන් වැරදි ක්‍රියාවන්ගෙන් ඉවත් වී ක්‍රියා කිරීම යි.

**පරිත්‍යාගය** යනු රට, ජාතිය, ආගම වෙනුවෙන් විශේෂ මෙහෙවරයන්හි නිරත වන පුද්ගලයන්ට හා ආයතනවලට කළ මෙහෙය ඇගයීම සඳහා ලබාදෙන විවිධ ත්‍යාගයන් ය.

**ඍජු බව** යනු ජනතා ප්‍රශ්නවල දී පාලකයා පක්ෂග්‍රාහී නො වී සතර අගතියෙන් ඉවත් වි අවංක ව යුක්තිය ඉටු කිරීමයි.

**මෘදු බව** යන්නෙන් අදහස් කෙරෙන්නේ දරුණු නොවීම යි. එනම් ඒ ඒ අවස්ථාවට ගැළපෙන ජනතා හිතවාදී මෘදු පාලන ක්‍රමයක් පවත්වා ගෙන යෑම යි.

**තපස** යනු ආවේගශීලී නොවී කටයුතු කිරීම යි. පාලකයාගේ මානසික ශික්ෂණය යි.

**අක්‍රෝධය** නම් සියලු රට වැසියා තම දරුවන් සේ සලකා කටයුතු කිරීමත් ඔවුන්ට ක්‍රෝධ නොකර තම පාලන කටයුතු මෙහෙයවීමත් ය.

**අවිහිංසාව** යන්නේ අදහස් කර ඇත්තේ රටවැසියා හිංසාවට පීඩාවට පත් කරවන පාලන පිළිවෙත් පිටුදක දහැමින් සෙමෙන් කටයුතු කිරීම යි.

**ඉවසීම** නම් ක්ෂණික තීරණ නොගෙන ආචාරශීලී ව බුද්ධිය මෙහෙයවා කටයුතු කිරීම යි. විරෝධාකල්පවලින් තොර ව ජනතා හඬට සවන් දී ඔවුන්ට කාරුණික වීම **අවිරෝධතාව** හෙවත් නොගැටෙන සුලු බව යි. එය දසවැනි රාජධර්මය යි. මේ අනුව දස රාජධර්ම තුළින් රටක සාමය සමගිය හා සදචාරය ගොඩනැගුණු සමෘද්ධිමත් රටක් බිහි කිරීමට අවශ්‍ය ඉගැන්වීම් දක්වෙන බව පැහැදිලි ය.


## දස සක්විති වත්

පාලකයකු ජනතා හිතවාදී පාලන ක්‍රමයක් ගොඩ නගා ගැනීමට අනුගමනය කළ යුතු බෞද්ධ ප්‍රතිපත්ති දහයක් දස සක්විති වත් ලෙස නම් කර ඇත. ඒවා,

1. තමා දසකුසල කර්ම කරමින් ධර්මයෙහි පිහිටා ධර්මානුකූල ව අඹුදරුවන් ද එහි පිහිටුවීම හා ඔවුන්ට කළ යුතු සංග්‍රහ කරමින් රැක බලා ගැනීම
2. තම බල සේනාව ද නිසි පරිදි සංග්‍රහ කොට ආරක්ෂා කිරීම
3. රාජ්‍ය තාන්ත්‍රිකයන් නිසි පරිදි සංග්‍රහ කොට ආරක්ෂා කිරීම
4. බ්‍රාහ්මණ ගෘහපතියන් ද නිසි පරිදි සංග්‍රහ කොට ආරක්ෂා කිරීම
5. ගම් දනව් වැසියන් ද නිසි පරිදි සංග්‍රහ කොට ආරක්ෂා කිරීම
6. මහණ බමුණන් ද එසේ සංග්‍රහ කොට ආරක්ෂා කිරීම
7. සිවුපා, පක්ෂි ආදීන්ට අභය දානය දී ආරක්ෂා කිරීම
8. තම රටෙහි අධාර්මික ක්‍රියා සිදු නොවන අයුරින් ක්‍රියා කිරීම
9. දිළිඳු ජනයාට ධනය ලබා දෙමින් රැක බලා ගැනීම
10. සිල්වත් මහණ බමුණන් කරා ගොස් අවවාද අනුශාසනා ලබා ගැනීම

යනුවෙන් පෙන්වා දී ඇත. මෙම ශ්‍රේෂ්ඨ වූ පිළිවෙත් දහය අනුගමනය කිරීමෙන් පාලකයා පරමාදර්ශී ජනහිතකාමී උතුම් කෙනෙක් බවට පත් වෙයි. මෙහි දැක්වෙන කරුණුවලින් සමාජයේ ඇති වන යහපතක් නම් පාලකයා රටේ ද ජනතාවගේ ද සතුන් සිව්පාවුන්ගේ ද ආරක්ෂකයා වීම ය. ඒ අතර මහණ බමුණන්ට රැකවරණය සැලසීම ආගමික වශයෙන් පාලකයා දක්වන අනුග්‍රහය යි. නීතිය හා සාමය පවත්වා ගැනීම පිළිබඳ අටවන කරුණින් ද ආර්ථික සමෘද්ධිය ඇති කිරීම නව වැනි කරුණින් ද උගන්වයි. අත්තනෝමතික ව ක්‍රියා කිරීමෙන් වැළකී ජනහිතකාමී පාලනයක් ගෙන යාම දහවන කරුණින් පැහැදිලි කෙරේ. මේ සියල්ල සංක්ෂිප්ත ව සැලකීමේ දී

- ධාර්මික රාජ්‍ය පාලනය
- ජනජීවිත හා අනෙකුත් සත්ත්ව ජීවිත සුරක්ෂිත කිරීම
- ආර්ථික සමෘද්ධිය ගොඩ නැගීම
- පිදිය යුත්තන් පිදීම හා අවවාද ගරු කොට සැලකීම, වශයෙන් දැක්විය හැකි ය.



## සප්ත අපරිහානීය ධර්ම

බුද්ධකාලීන වජ්ජි සමූහාණ්ඩුවේ ස්ථාවර බව පැවැතියේ සප්ත අපරිහානීය ධර්ම නිසා ය. ඒවා වජ්ජීන්ට හඳුන්වා දෙනු ලැබුයේ බුදුරජාණන් වහන්සේ විසිනි. ධාර්මික රාජ්‍ය පාලනයකට සප්ත අපරිහානීය ධර්ම ද මහඟු පිටුවහලකි. එම අපරිහානීය ධර්ම හත මෙසේ ය.

1. නිතර නිතර රැස්වීම
2. සමගියෙන් රැස්ව සමගියෙන් ක්‍රියා කොට සමගියෙන් විසිර යාම
3. නොපැන වූ නීති නො පැනවීම, පැන වූ නීති කඩ නො කිරීම
4. වැඩිහිටියන්ට ගරු කිරීම
5. විවාහ නො වූ කුල කුමරියන්ට ආරක්ෂාව සැලසීම
6. වජ්ජි ජනපදයෙහි හා පිටත පූජනීය ස්ථානවලට ගරු කිරීම
7. තම ජනපදයට පැමිණෙන රහතන් වහන්සේට පහසුකම් හා ආරක්ෂාව ඇති කිරීම

මෙම කරුණු හත රාජ්‍ය පාලකයා හෝ ආයතනයක ප්‍රධානයකු අනුගමනය කරන්නේ නම් එහි දී නීතිය, සාමය, සාධාරණත්වය හා ආගමික දියුණුව ද සැලසෙන බව පැහැදිලි වේ. මෙහි එන කරුණු හතෙන් පළමුවැන්න හා දෙවැන්න රටක හා සමාජයක සාමය ඇති කරවීමේ පණිවුඩය ලබා දේ. තුන්වැනි කරුණ පැහැදිලි කර දෙන්නේ නීතිය ඉදිරියේ සාධාරණත්වය ඉටුකිරීම ය. හතරවැනි හා පස්වැනි කරුණු පසක් කර දෙන්නේ සදාචාරාත්මක බවයි. හය සහ හත යන කරුණු දෙක පාලකයා සතු ආගමික කාර්යභාරය මැනවින් පැහැදිලි කරයි. මේ අනුව සප්ත අපරිහානීය ධර්ම පාලන තන්ත්‍රයට එක් කර ගැනීමෙන් දැහැමි පාලනයක් ගොඩනැගෙන බව ඉගැන්වේ. රටවැසියාට විශ්වසනීයත්වයෙන් හා සාමයෙන් පිරුණු රටක හෝ ආයතනයක කටයුතු කිරීමට ඉඩකඩ සැලසෙන බවත් පැවසිය හැකි ය.

## සතර අගතියෙන් වැළකීම

පාලකයා කවර කරුණක දී වුව ද අන්තගාමී වන්නේ නම් එවැනි රටක සාධාරණය, යුක්තිය කිසිදු අයුරකින් ඉටු නො වේ. මේ නිසා ජනතා සුභ සිද්ධිය අපේක්ෂා කරන පාලකයා සතර අගතියෙන් වැළකී පාලන කටයුතු මෙහෙය විය යුතු ය.

**ඡන්දය, ද්වේෂය, භය, මෝහය**

යන කරුණු හතරින් අන්තගාමී ව කටයුතු කරන පාලකයා අව පක්ෂයේ සඳ මෙන් පිරිහීමට පත් වේ. අන්තගාමී නොවන්නා පුර පක්ෂයේ සඳ මෙන් අභිවෘද්ධියට පත් වේ. මෙහි **ඡන්දය** යනු යම් යම් දෑ පිළිබඳ පුද්ගල කැමැත්ත යි. ස්වතන්ත්‍රව ගනු ලබන තීරණ හා කළ යුතු නොකළ යුතු දේ පිළිබඳ ගනු ලබන තීරණ ද මෙයට අදාළ වේ. එ බැවින් පාලකයා සෑම විට ම යුක්තිය සර්ව සාධාරණත්වය ඉටුවන අයුරින් නිවැරදි තීරණ ගැනීම අගතියෙන් වෙන් වීමකි. එ බැවින් ලාභ, ප්‍රයෝජන, ඥාති සම්බන්ධතා සිය රුචි අරුචිකම් හා පක්ෂපාතීත්වය සලකා තීරණ ගන්නේ නම් එය ඡන්දයෙන් අගතියට යාමකි. එ බැවින් සුදුස්සාට සුදුසු තැන ලබා දී අපක්ෂපාති ව කටයුතු කිරීම යහපත් පාලනයකට මඟ සලසන බව බුදුදහම උගන්වයි.

යුතුකම්, සුදුසුකම් හා සාරධර්ම පිළිබඳ යථා අවබෝධය නොමැති ව සමගිය හා සාමදනය පිටුදක කටයුතු කිරීම **ද්වේෂය** යි. රට වැසියා හෝ නිලධාරීන් වැරදි කරන විට දඬුවම් පැමිණවීම ඔවුන්ගේ අභිවෘද්ධියට හේතු වන පරිදි සිදු කළ යුතු ය. එසේ නොමැති ව පාලකයා දෘඩි අන්තවාදී දූෂිත මනෝභාවයකින් හෙබි පුද්ගලයකු නම් ඔහු තුළ මධ්‍යස්ථ සිතුවිලි ඇති නො වේ. එබඳු දූෂිත පාලනයක් තුළින් ජනතාව පීඩාවට පත් වේ. යහපත් පාලනයක් සඳහා ද්වේෂය පිටුදැකිය යුතු බව බුදුදහම අවධාරණය කරයි.

පාලකයා සෑම විට ම මැති ඇමති ගණයා වෙත ද සෙසු නිලධාරීන් ගැන ද, වෙනත් පාලකයන් ගැන ද මහත් භීතියකින් පසු වීම **භය** ලෙස හැඳින්වෙයි.

එහෙත් විශිෂ්ට චරිතයක් ඇති පාලකයා කිසිදු විටක බිය නො වේ. හෙතෙම බුද්ධිමත් ව කටයුතු කරයි. භය ඉස්මතු වන්නේ ආත්මාර්ථය නිසා ය. එ බැවින් බියෙන් පසු වන පාලකයා ජනතාව ද නිලධාරීන් ද අයථා ලෙස පෙළීමට පත් කරන හෙයින් බුදුදහම භය අගතියක් ලෙස උගන්වයි.

රාජ්‍ය පාලනයේ දී පාලකයාට තීක්ෂණ බුද්ධියක් තිබීම අත්‍යවශ්‍ය වූ දෙයකි. එබැවින් ඔහු **මෝහය** හෙවත් මුළාව මුලිනුපුටා දැමිය යුතු ය. මෝහය සියලු වැරදි ක්‍රියාවන්ට මුල් වන අකුසල මූලයක් හෙයින් එය අගතියක් ලෙස බුදුදහම උගන්වයි. පාලකයා බුද්ධිහීන, අඥාන මෝඩයකු නම් ඔහුට යහපත් පාලනයක් ගෙන යාම ඉතාමත් අපහසු ය. යුක්තිය - අයුක්තිය යහපත - අයහපත වටහා ගැනීමට පාලකයකු මුළාවෙන් තොර විය යුතු ය. එයින් අගතියට නොයා යුතු ය.

## සතර සංග්‍රහ වස්තු

සාර්ථක දැහැමි රාජ්‍ය පාලනයක් සඳහා අවශ්‍ය වන තවත් පිළිවෙතක් නම් සතර සංග්‍රහ වස්තු අනුගමනය කිරීම ය.

දානය, ප්‍රිය වචනය, අර්ථ චර්යාව, සමානාත්මතාව

යනු ඒ හතරයි. මෙයින් දානය පිළිබඳ දසරාජ ධර්මවල දී විස්තර කර ඇත. රාජ්‍ය පාලනයේ දී අවශ්‍ය වන අනෙක් වැදගත් අංගය වන්නේ රාජ්‍ය පාලකයා ප්‍රිය වචන කථා කිරීමයි. ජනතාව බොරුවෙන් චාටුවෙන් මුළා කිරීමට පාලකයකුට අයිතියක් නැත. සෑම විට ම බුදුදහම සත්‍යවාදීත්වය අගය කරන බැවින් පාලකයා ජනතා සුභ සිද්ධිය සඳහා මිහිරි වදන් ප්‍රකාශ කළ යුතුයි. එවිට ජනතාව ඔහු වෙතට ඇදී එති. අර්ථචර්යාව යනු පරාර්ථ චර්යාවයි. බෞද්ධ පිළිගැනීම වන්නේ රාජ්‍යත්වය යනු ජනතා සේවයෙහි සංකේතයක් බවයි.එහි දී පාලකයා කාය බලය හා බුද්ධි බලය උපරිම වශයෙන් වැය කොට පරාර්ථ චර්යාවෙහි නිරත වෙයි. රට වැසියන්ට මහඟු සේවයක් කිරීම රජතුමාගේ පරම යුතුකම වෙයි. එසේ කරන විට ඔහු තුළ **මෙත්තා, කරුණා, මුදිතා, උපෙක්ඛා** යන සතර බ්‍රහ්ම විහරණ ප්‍රගුණ වෙයි. එවැනි මානසික තත්ත්වයක් ඇති පාලකයා ජනතාව තම දරුවන් සේ සලකා ක්‍රියා කරන්නෙකි.

**සමානාත්මතාව** යනු දුක සැප දෙක සම සම ව බෙදා ගෙන ජීවත් වීම සහ කුලය, ජාතිය, ආගම, භාෂාව, වර්ණය ආදිය නොසලකා සියලු දෙනාට සමාන ව සේවය කිරීමයි. දැහැමි පාලකයා ද සෑම විට ම මෙම ලක්ෂණ වලින් පොහොසත් විය යුතු බව බුදුදහම අවධාරණය කරයි. මේ අයුරින් ක්‍රියා කරන බෞද්ධ පාලකයා පඤ්චසීල ප්‍රතිපදාව රැකීම නිසා ද තව දුරටත් ධාර්මික වේ.

1. ජීවත් වීම පිළිබඳ ඇති අයිතිය පිළිගෙන ආරක්ෂා කරයි
2. සම්පත්වල සුරක්ෂිතතාව පිළිබඳ ඇති අයිතිය පිළිගෙන ආරක්ෂා කරයි
3. නිරවුල් ව විවාහ ජීවිතයක් පවත්වා ගෙන යාමේ ඇති අයිතිය පිළිගෙන ආරක්ෂා කරයි
4. රැවටිලිවලට හසු නොවී ජීවත් වීමට ඇති අයිතිය පිළිගෙන ආරක්ෂා කරයි
5. නිරෝගී, බුද්ධිමත්, සාමකාමී ජීවිතයක් ගත කිරීමට ඇති අයිතිය පිළිගෙන ආරක්ෂා කරයි

දැහැමි ප්‍රතිපදාවෙන් යුක්ත වන පාලකයකු ජනතාව සෑම විට ම අපේක්ෂා කරන බව "රාජා භවතු ධම්මිකෝ " යන ප්‍රාර්ථනාවෙන් ද පැහැදිලි වේ. එ බැවින් සදාචාර සම්පන්න දැහැමි පාලනයක් තුළ ජනතාවගේ ප්‍රාර්ථනා ඉටු වන දැහැමි රාජ්‍යයක් ගොඩ නැගීමට අපි සියලු දෙනා ම ඇප කැප වෙමු.

## සාරාංශය

රාජ්‍ය පාලනය ධාර්මික වන විට රටත් සමාජයත් ධාර්මික වේ. එම ධාර්මිකත්වය තුළින් රටේ සෞභාග්‍යය ඇති වේ. පාලකයාට ධාර්මික වීම සඳහා අවැසි කරුණු රාශියක් බුදුදහමෙහි ඉගැන් වේ. දස රාජ ධර්ම, දස සක්විති වත්, සප්ත අපරිහානීය ධර්ම, සතර අගතියෙන් වැළකීම, සතර සංග්‍රහ වස්තු, සතර බ්‍රහ්ම විහාර, පඤ්චසීල ප්‍රතිපදාව යනා දී වශයෙන් ඒවා හඳුන්වා ඇත.



## ක්‍රියාකාරකම්

01. දස රාජධර්ම නම් කරන්න.
02. දැහැමි පාලනයක් තුළ සාමය සුරකෙන අයුරු කෙටියෙන් දක්වන්න.
03. ඔබ නායකයකු වූ විට අනුගමනය කරන දැහැමි ප්‍රතිපත්ති පහක් නම් කරන්න.



## පැවරුම

01. ''නිවැරැදි නායකත්වයට මඟ'' යන තේමාව යටතේ පන්ති සඟරාවකට ලිපියක් සකස් කරන්න.

කිසිවක් පටන් ගෙන
එහි හරි වැරදි ඇසුමෙන
එලක් නැති බව දැන
අසනු මුලදි ම හිතැති අයගෙන

සිරිත් මල්දම